අගලවත්ත ප්‍රාදේශීය සභාව
කළුතර දිස්ත්‍රික්කය
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රු.70,400 කට මිලදී ගත් සංගීත උපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.220,000ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ලී බඩු හා උපකරණ වටිනාකම හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම රු.149,600 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය අනුව හෙළිදරව් වූ කැකුලන්දල පෙර පාසැලේ තිබූ භාණ්ඩ අයිතම 19 ක් ගිණුම්ගත වී නොතිබුණි.

(ඇ) සභාවට අයත් භාණ්ඩ අයිතම 14 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයන්ට අදාළ රු.53,549 ක ගෙවිය යුතු වියදම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට මෝටර්රථ හා කරත්ත ගිණුමේ ශේෂය රු.53,036,433 ක් වුවත් පාලින්දනුවර ප්‍රදේශීය සභා වෙන්කිරීම් ලෙස රු.1,224,851 ක් අඩුකිරීම හේතුවෙන් මෝටර්රථ හා කරත්ත ගිණුමේ ශේෂය රු.1,224,851 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

1:3:2 **නොසැසඳුණු ගිණුම්**

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.8,610,268 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.666,398 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව පාලින්දනුවර ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු ශේෂය රු. 5,342,424 ක් හා පාලින්දනුවර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ශේෂය රු.7,782,632 ක් ලෙසද , පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව අගලවත්ත ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු ශේෂයරු.5,931,815 ක් ලෙසද දක්වා තිබුණි.

1.3.3 **අවිනිශ්චිත ගිණුම**

සමාලෝචිත වර්ෂයට අදාළ ශේෂ පිරික්සුමේ හර ශේෂයන්ගේ එකතුව ඉක්මවූ බැර ශේෂයන්ගේ එකතුව රු.374,499 ක් වූ අතර එම වෙනස හඳුනාගෙන ගිණුම්වලට ගැලපීමට කටයුතු නොකොට පෙර ගෙවුම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) 2009 සිට 2013 දක්වා කාල පරාසයට අදාළ රු.947,130 ක්වූ කර්මාන්ත ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට පැවත එන පාලින්දනුවර ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු රු.7,782,632 ක ශේෂය හා පාලින්දනුවර ප්‍රාදේශිය සභාවෙන් ලැබිය යුතු රු.5,342,424 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

1.3.5 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,610,109 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/ සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1:3:6 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | ---- | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ යම් නිශ්චල දේපළක හෝ නිශ්චල දේපළ වර්ගයක වාර්ෂික වටිනාකම මත වරිපනම් බද්දක් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව අය කළ යුතු වුවත් සභාව විසින් වරිපනම් බදු සඳහා නව හඳුනා ගැනීමක් සිදු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) රීති 197 | ---- | එක් එක් මාසය අවසානයේදී පරිභෝජන ගබඩා ද්‍රව්‍ය ලේඛනය පිරික්සා ලේකම්වරයා විසින් අත්සන යොදා නොතිබුණි. |
| (ii) රීති 218 | 41,701,404 | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| මුදල් රෙගුලාසි 1647(ආ) | ---- | සභාව සතුව පවතින වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ---- | පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනගත කිරීම් කර නොතිබුණි. |

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2:1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,343,281 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,038,346 ක් විය.

2:2 **<u>ආදායම් පරිපාලනය</u>**

2:2:1 <u>ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 2,638,297 | 3,183,488 | 3,179,306 | 918,133 | 3,228,000 | 2,907,619 | 2,846,074 | 749,831 |
| (ii) කුලී | 8,440,000 | 8,670,483 | 8,689,897 | 112,612 | 8,166,500 | 8,781,281 | 7,917,494 | 132,026 |
| (iii) බලපත්‍ර ගාස්තු | 285,000 | 335,509 | 335,509 | - | 236,500 | 220,565 | 174,480 | - |
| (iv)වෙනත් ආදායම් | 11,083,000 | 13,623,873 | 9,766,919 | 3,856,955 | 10,681,500 | 13,172,144 | 12,884,854 | - |

2.2.2 <u>ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.881,857 ක් වූ අතර වර්ෂයට අදාළ බිල් කිරීම් රු.25,813,354 ක් විය. වර්ෂය තුළ ලැබීම් කපා හැරීම් හා ගැලපුම් රු.21,807,512 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සමස්ථ ආදායම් හිඟය රු.4,887,699 ක් විය.

2.2.3 <u>කුලී</u>

තරුණ සේවා මධ්‍යස්ථානය පිහිටි භූමිය බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,419,617 ක් හා මුද්දර ගාස්තු රු.8,000,000 ක් විය.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3:1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 05 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

2017 වර්ෂයේ ප්‍රාදේශීය සභාව විසින් කසළ කළමනාකරණය වෙනුවෙන් රු.6,045,897 ක වියදමක් දරා තිබුණි. මෙම පිරිවැය ආවරණය කර ගැනීමට කසළ බදු පැනවීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත් භාවයෙන් යුක්ත බව දන්වා තිබුණද පහත සඳහන් කරුණු අනුව සභාවට මේ පිළිබඳ දැනුවත්භාවයක් නොතිබූ බව නිරීක්ෂණය විය.

(i) තිරසර සංවර්ධන ඉලක්ක මැනීම සඳහා දර්ශක ඉදිරිපත් කර නොතිබීම.

(ii) අවශ්‍ය දත්ත හඳුනාගෙන නොතිබීම.

(iii) දත්ත රැස්කිරීම සඳහා පත්කර ඇති නිලධාරියාට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුවත්බවක් හා පළපුරුද්දක් නොතිබීම හා දත්ත වල නිවැරදිතාවය තහවුරු කිරීම සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ක්‍රමවේදයක් සකසා නොතිබීම.

(iv) අවශ්‍ය යටිතල පහසුකම් හඳුනාගෙන නොතිබීම හා සභාව සතුව ප්‍රමාණවත් භෞතික පහසුකම් නොතිබීම.

(v) මෙම වැඩසටහන සඳහා ආයතනය සතු කාර්ය මණ්ඩලය යොදවා ගැනීමේ ක්‍රමවේදයක් හා කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් නොපැවතීම.

3:2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) සභාව විසින් විගණනයට ලබා දුන් තොරතුරු අනුව 2017 දෙසැම්බර් 31 ට ද්විතීයික මට්ටමේ තනතුරු 03 ක , ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක හා කොන්ත්‍රාත් මට්ටමේ තනතුරු 04 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) වාහන 25 ක් ක්‍රියා කරවීම පිණිස සභාව සතුව සිටිනුයේ රියදුරන් 08 ක් හා යන්ත්‍ර ක්‍රියාකරුවන් 03 ක් පමණි.

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

<u>වරිපනම් තක්සේරු නොකිරීම</u>

වරිපනම් අය කිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියලුම නිශ්චල දේපළ වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් අගලවත්ත ප්‍රදේශීය සභාවේ මාර්ග කිහිපයක් හැර ඉතිරි වරිපනම් කලාප වල 2010 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරු සිදු කර නොතිබුණි.

3.4 <u>වත්කම් කළමනාකරණය</u>

<u>පවරා නොගත් වත්කම්</u>

(අ) සභාව සතුව සුසානභූමි 26 ක් තිබූ නමුත් 2018 ජනවාරි 15 වන විට පවරාගෙන තිබුණේ එකක් පමණි.

(ආ) ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති හැලඹ ක්‍රීඩාපිටිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

3.5 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>

අගලවත්ත ආපදා කළමණාකරණ මධ්‍යස්ථාන දෙමහල් ගොඩනැගිල්ල සභාව සතු ඉඩමක 2010 වර්ෂයේදී කොරියානු ඉදිකිරීම් සමාගමක් මගින් ඉදි කරවා විධිමත් ලිඛිත ගිවිසුමකින් තොරව සභාව වෙත පවරා තිබුණි. මෙම ගොඩනැගිල්ල නිසි ගුණාත්මකභාවයකින් හා ප්‍රමිතියකින් තොරව ඉදිකර තිබීම නිසා කඩා ඉවත් කළ යුතු තත්ත්වයක් උද්ගත වී තිබුණි. මේ සඳහා සභාවට රු.643,023 ක වියදමක් දැරීමට සිදු වී තිබුණි.

3.6 <u>හඳුනාගත් පාඩු</u>

2016 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අනුව ජී. අයි බට 50 ක ඌණතාවයක් අනාවරනය වී තිබූ අතර එහි සම්පූර්ණ වටිනාකම රු.80,548 ක් ලෙස ගණනය කර තිබුණි. කෙසේ වුවද , එම පාඩුවෙන් එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.48,676 ක මුදල 2018 ජූලි 20 දින වන විටත් අයවී නොතිබුණි.

3.7 <u>ප්‍රසම්පාදනය</u>

<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

(අ) කිතුල්ගොඩ නාහේන පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමේ කර්මාන්තය ඉටු කිරීමේදී මාර්ගයේ දෙපස පස් වලින් පුරවා නොතිබුණි.

(ආ) අගලවත්ත, පින්නගොඩ , කොස්ගහහේන පොදු මාර්ගයේ ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ දෙවන වර තාර දැමීම නිසි පරිදි සිදුකර නොතිබුණි.

- (i) මාර්ගය සමතුලිත කර නොතිබුණ අතර මද වශයෙන් ගිලා බැස තිබුණි.
- (ii) මාර්ගයේ මීටර් 78 ස්ථානයේදී නිසි පරිදි ABC මිශ්‍රණය යොදා නොතිබුණි.

(ඇ) පින්නගොඩ නාවිටිගල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ මාර්ගයේ ගැඹුර මීටර් 0.125 ක් තිබිය යුතු වුවත් මාර්ගයේ මීටර් 19.5 ස්ථානයේ ගැඹුර මීටර් 0.0769 ක් හා මීටර් 30.1 ස්ථානයේ ගැඹුර මීටර් 0.102 ක් විය.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

**<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ගත හා තථ්‍ය ආදායම් සියයට 25 සිට සියයට 93 දක්වාත්, වියදම් සියයට 37 සිට සියයට 265 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරික්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| <u>පද්ධතිය</u> | <u>අඩුපාඩුව</u> |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් වල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම් තිබීම |
| | ii. වියදම් හා ණයහිමි ප්‍රතිපාදන සැලසීමේදී සමහර වියදම් අත්හැරී තිබීම |
| (ආ) වත්කම්/ දේපළ | සුසානභූමි හා ක්‍රීඩාපිටි පවරා නොගැනීම |
| (ඇ) තොග | ගබඩා හා තොග පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදු නොවීම |
| (ඈ) සේවක කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම |
| (ඉ) ව්‍යාපෘති/කොන්ත්‍රාත් | i . ප්‍රමාණවත් අධීක්ෂණයක් නොවීම |
| | ii . නිසි ප්‍රමිතියක් නොමැති වීම |
| | iii. ඉටු නොකළ වැඩ කොටස් සඳහා ගෙවීම |
| (ඊ) අයවැය පාලනය | i . අයවැය හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම |
| | ii. ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම |